# ඇල්පිටිය ප්‍රාදේශීය සභාව

## 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2025 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා පිළිගත් නිෂ්පාදකයින්ගෙන්, සැපයුම්කරුවන්ගෙන් හා ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් 2024.12.15 දින හෝ ඊට ප්‍රථම ලේකම් - ඇල්පිටිය ප්‍රාදේශීය සභාව, ඇල්පිටිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2025 වර්ෂය"** යනුවෙන් සඳහන් කල යුතුය. ඒ ඒ සැපයුම් හා සේවාවන් සඳහා ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු.1500/- ක මුදලක් ද, ඉදිකිරීම් හා කොන්ත්‍රාත්කරුවන් සඳහා ලියාපදිංචි ගාස්තු වශයෙන් එම අයිතම ඉදිරියෙන් දක්වා ඇති මුදල ද (වැට්බදු රහිතව) ලේකම් - ඇල්පිටිය ප්‍රාදේශීය සභාව, ඇල්පිටිය නමින් ලියන ලද චෙක් පතක් හෝ මුදල් ඇණවුමක් මගින් එවිය යුතුය.

03. තමා විසින් සකස් කර ගත් අයදුම්පත සමග අදාල සහතික වල පිටපත් (සියළුම විස්තර සහිතව) අමුණා එවිය යුතුය.

**අයිතම** **සැපයුම් හා සේවා**

1. කාර්යාලීය උපකරණ/ ලී බඩු/ වානේ ගෘහ භාණ්ඩ
2. ලිපි ද්‍රව්‍ය/ කඩදාසි/ අභ්‍යාස පොත්/ පාසල් බෑග්/ වතුර බෝතල් ඇතුළුව අනෙකුත් ලිපි ද්‍රව්‍ය හා සියළුම උපකරණ
3. විදුලි උපකරණ හා වීථි පහන් උපකරණ
4. කොන්ක්‍රීට් කම්බි කණු, හියුම් පයිප්ප/ අනෙකුත් කොන්ක්‍රීට් භාණ්ඩ
5. ටයර්, ටියුබ්, බැටරි සැපයීම හා නැවත පිරවීම
6. වාහන යන්ත්‍ර සූත්‍ර අමතර කොටස් හා උපාංග
7. ඉලෙක්ට්‍රොනික යතුරු ලියන/ ඡායා පිටපත් යන්ත්‍ර/ ෆැක්ස් යන්ත්‍ර/ රෝනියෝ යන්ත්‍ර/ ඩුප්ලෝ මැෂින්/ පරිගණක/ පරිගණක ටෝනර්/ CCTV කැමරා සහ අනෙකුත් උපාංග සැපයීම
8. ක්‍රීඩා භාණ්ඩ/පෙර පාසල් උපකරණ
9. පුස්තකාල පොත්පත්/ සඟරා/ පුවත්පත්
10. කොන්ක්‍රීට් ගල්/ වැලි/ බ්ලොග් ගල්/ ඉංජිනේරු ගඩොල්/ තාර/ ABC/ ප්‍රිමික්ස්/ ගොඩනැගිලි හා මාර්ග ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීම
11. ඉදල්, කොසු, බුරුසු, කුඩා පාපිසි, ලයිසෝල්, ගම්බූට්, කසල බඳුන්, අත් වැසුම්, මුඛ ආවරණ, වේවැල් කූඩ හා වැහි කබා, හාපික්
12. පැරණි පුවත්පත් මිලදී ගැනීම
13. සෞඛ්‍ය ආරක්ෂණ රසායනික ද්‍රව්‍ය (කෘමි නාශක, වල් නාශක, හාපික් අතුළු උද්‍යාන අලංකරණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා පොහොර වර්ග)
14. ගෑස් සිලින්ඩර්
15. සිමෙන්ති, යකඩ, සරනේරු කම්බි, තීන්ත, සෙවිලි තහඩු, ඇණ වර්ග, හාඩ්වෙයාර් උපාංග සහ අනෙකුත් ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය
16. පෙරපාසල් පාසල් නිල ඇඳුම් සැපයීම
17. කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ හා ආදායම් පරීක්ෂක නිල ඇඳුම් සැපයීම
18. අනතුරුදායක ගස් ඉවත් කිරීම
19. භාෂා පරිවර්තකවරුන්

**සේවාවන්**

20. ඉඩම් මැනීම හා තක්සේරු සේවා කටයුතු කිරීම
21. මුද්‍රණ කටයුතු හා මුද්‍රිත පෝරම
22. උද්‍යාන අලංකරණය
23. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම
24. පරිගණක ඇතුළු සියලුම කාර්යාල යන්ත්‍ර හා උපාංග අලුත්වැඩියා කිරීම

| **ඉදිකිරීම් හා කොන්ත්‍රාත්කරුවන්** | | **ලියාපදිංචි ගාස්තුව** |
|---|---|---|
| 25. රුපියල් 50,000.00 දක්වා | - | රු.1100.00 |
| 26. රුපියල් 50,001.00 සිට 100,000.00 දක්වා | - | රු.1150.00 |
| 27. රුපියල් 100,001.00 සිට 500,000.00 දක්වා | - | රු.1200.00 |
| 28. රුපියල් 500,001.00 සිට 1,000,000.00 දක්වා | - | රු.1350.00 |
| 29. රුපියල් 1,000,000.00 ට වැඩි | - | රු.1600.00 |

**පොදු කොන්දේසි**

01. අවශ්‍ය අවස්ථාවලදී ලියාපදිංචි සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් හැරුණු විට වෙනත් සැපයුම්කරුවන් හෝ සැපයුම් සේවා ලබා ගැනීමේ බලය සභාව සතු වේ.
02. නිසි වේලාවට ඇණවුම් සැපයීමට අපොහොසත් වන හා මිල ගණන් කැඳවීමේ කොන්දේසි වලට අනුකූලව ක්‍රියාකරනු නොලබන සැපයුම්කරුවන් කිසිදු දැනුම්දීමකින් තොරව සැපයුම් කටයුතු වලින් ඉවත් කිරීමට සිදුවේ.
03. සභාවට සැපයුම් කිරීමට අත්තිකාරම් මුදල් ඉල්ලා සිටින සැපයුම්කරුවන්ගේ නම් ලියාපදිංචි කරනු නොලැබේ. අවම වශයෙන් දින 60 ක කාල සීමාවකට සභාව වෙත ණය පහසුකම් ලබාදිය යුතුය.
04. ඉදිකිරීම් හා කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීමේදි ඉක්ටැඩ් ආයතනයේ හෝ දකුණු පළාත් සභාවේ ලියාපදිංචි වීමේ සහතික පිටපත් හා වත්කම් ප්‍රකාශ වල පිටපත් අයදුම් පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය. ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි ස්ථිර පදිංචියක් ඇති කොන්ත්‍රාත්කරුවන්ට මූල්‍යමය හා ඉදි කිරීම් කටයුතු පිළිබඳ පළපුරුද්ද සඳහා සහතික පත්‍ර ඉදිරිපත් කර ලියාපදිංචි විය හැකිය.
05. සැපයුම් කටයුතු කිරීමේදි ප්‍රාදේශීය සභා පනත මුදල් රෙගුලාසි හා මූල්‍ය රීති අනුවද රජය මඟින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරවද, ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන කොන්දේසි වලටද එකඟ විය යුතුය.

විශේෂ කොමසාරිස්/ ලේකම්
ඇල්පිටිය ප්‍රාදේශීය සභාව